# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 4 දරන වීථි නම් කිරීමේ සහ ස්මාරක පිහිටුවීම පාලනය කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 1975 පෙබරවාරි මස 4 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1975 පෙබරවාරි මස 21 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 4 දරන වීථි නම් කිරීමේ සහ ස්මාරක පිහිටුවීම පාලනය කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 1975 පෙබරවාරි මස 4 වන දින]

එල්. ඩී.—ඕ. 46/73

**වීථි නම් කිරීම සඳහා ද, රාජ්‍ය දේපළවල ස්මාරක පිහිටුවීම පාලනය කිරීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 4 දරන වීථි නම් කිරීමේ සහ ස්මාරක පිහිටුවීම පාලනය කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි දිනයක මේ පනත ක්‍රියාත්මක වන්නේ ය. ක්‍රියාත්මක වීමේ දිනය.

3. මහා නගර සභා ආඥාපනතේ 71 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— (252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනතේ 71 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියෙහි (1) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) අමාත්‍යවරයා විසින්, සිය මෙහෙයීමෙන් ම හෝ මහා නගර සභාවක් විසින් කරනු ලැබූ ඉල්ලීමක් පිට, යම් වීථියක් හැඳින්විය යුතු නාමය තීරණය කළ යුතු අතර යම් විටක යම් වීථියක නාමය වෙනස් කිරීම ද ඒ ආකාරයෙන් ම කළ යුතු ය."; සහ

(2) ඒ වගන්තියෙහි (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

4. නගර සභා ආඥාපනත පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම.

(1) 55 වන වගන්තියෙහි, (3) වන ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(3) වීථි නාම සහ යම් පෞද්ගලික දේපළක පිහිටි නිවාසවල හෝ ගෙපත්වල අංක ඇඳීම ;"; සහ

(2) 55 වන වගන්තියට ඉක්බිතිව ම 55අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු පහත සඳහන් අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"වීථි නම් කිරීම. 55අ. අමාත්‍යවරයා විසින්, සිය මෙහෙයීමෙන් ම හෝ නගර සභාවක් විසින් කරනු ලැබූ ඉල්ලීමක් පිට, යම් වීථියක් හැඳින්විය යුතු නාමය තීරණය කළ යුතු අතර යම් විටක යම් වීථියක නාමය වෙනස් කිරීම ද ඒ ආකාරයෙන් ම කළ යුතු ය.".

ඒ 09861—8697 (74/10)

සුළු නගර සහ ආඥාපනත සංශෝධනය කිරීම.

5. සුළු නගර සභා ආඥාපනත පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) 57 වන වගන්තියෙහි, එහි (3) වන ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(3) වීථි නාම සහ යම් පෞද්ගලික දේපලක පිහිටි නිවාස වල හෝ ගෙපත්වල අංක ඇඳීම ;"; සහ

(2) 57 වන වගන්තියට ඉක්බිතිව ම 57අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු පහත සඳහන් අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"වීථි නම් කිරීම.

57අ. අමාත්‍යවරයා විසින්, සිය මෙහෙයීමෙන් ම හෝ සුළු නගර සභාවක් විසින් කරනු ලැබූ ඉල්ලීමක් පිට, යම් වීථියක් හැඳින්විය යුතු නාමය තීරණය කළ යුතු අතර යම් විටක යම් වීථියක නාමය වෙනස් කිරීම ද ඒ ආකාරයෙන් ම කළ යුතු ය.".

57අ වන අලුත් වගන්තිය ගම් සභා ආඥාපනතෙහි ඇතුළත් කිරීම.

6. පහත සඳහන් අලුත් වගන්තිය ගම් සභා ආඥාපනතේ 57 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ආඥාපනතේ 57අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"මාර්ග හෝ අතුරු මාර්ග නම් කිරීම.

57අ. අමාත්‍යවරයා විසින්, සිය මෙහෙයීමෙන් ම හෝ ගම් සභාවක් විසින් කරනු ලැබූ ඉල්ලීමක් පිට, යම් මාර්ගයක් හෝ අතුරු මාර්ගයක් හැඳින්විය යුතු නාමය තීරණය කළ යුතු අතර යම් විටක යම් මාර්ගයක හෝ අතුරු මාර්ගයක නාමය වෙනස් කිරීම ද ඒ ආකාරයෙන් ම කළ යුතු ය.".

ස්මාරක පිහිටුවීම පාලනය කිරීම.

7. යම් තැනැත්තකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත අමාත්‍යවරයා විසින් දෙන ලද පූර්ව අනුමතය ඇතිව මිස කිසිම තැනැත්තකු විසින් ජනරජයට අයිති යම් ඉඩමක හෝ යම් පළාත් පාලන ආයතනයක් සතු කර ඇති හෝ පළාත් පාලන ආයතනයකට අයිති යම් ඉඩමක ස්මාරකයක් පිහිටුවීම නොකළ යුතු ය.

ප්‍රසිද්ධ උද්‍යාන ආදිය නම් කිරීම.

8. අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව මිස යම් පළාත් පාලන ආයතනයක් විසින් යම් ප්‍රසිද්ධ උද්‍යානයක්, ක්‍රීඩා පිටියක්, පුස්තකාලයක්, කියවීම් ශාලාවක්, ක්‍රීඩාංගණයක්, ඔරලෝසු කණුවක්, පාලමක් හෝ නාන ළිඳක් නම් කිරීම නීත්‍යානුකූල නොවන්නේ ය.

අර්ථ නිරූපණය.

9. මේ පනතෙහි —

"අමාත්‍යවරයා" යන්නෙන් පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් සහ ගම් සභාවක් අදහස් වන අතර ගංගා නිම්න සංවර්ධන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය ද ඊට ඇතුළත් වේ.

"ස්මාරකය" යන්නට ජීවත්වන හෝ මිය ගිය යම් තැනැත්තකු සිහි කිරීම පිණිස පිහිටුවනු ලබන යම් ස්මාරකයක්, කුළුණක්, කණුවක් හෝ යම් ඉදිකිරීමක් ඇතුළත් වන නමුදු යම් සුසාන භූමියක හෝ මිනී පිටියක පිහිටුවනු ලබන යම් ඉදිකිරීමක්, සොහොන් කොතක් හෝ කුරුසියක් ඊට ඇතුළත් නොවේ.